රෝහිණී කවිරත්න
මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී

2025.11.11

1. විගණකාධිපතිතුමා,

ජාතික විගණන කොමිෂන් සභාව.

බත්තරමුල්ල.

2. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

කොළඹ 7.

3. අධ්‍යක්ෂ ජනරාල්,

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව.

කොළඹ 7.

**පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවේ අංක 14 යටතේ ‘‘වතු කම්කරුවන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම’’ සඳහා රු. මිලියන 5,000ක මුදල් යෝජනාව සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ නීතිමය හා පරිපාලනමය සාධාරණත්වය තහවුරු කිරීම**

අතිගරු තැනැත්තනි,

පසුගියදා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබූ අයවැය ප්‍රකාශනයේ අංක 14 යටතේ ‘‘වතු කම්කරුවන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම’’ සඳහා මුදල් අමාත්‍යාංශය සහ අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් රු. මිලියන 5,000ක යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

වතු කම්කරුවන්ට ජීවත්වීමට සරිලන වැටුපක් ලබාදීම ජාතික වගකීමකි. මේ වන විට ගෙවනු ලබන රු. 1,350ක මුදල රු. 1,550 දක්වා වැඩි කිරීම පමණක් නොව, සැබැවින්ම රු. 2,000 හෝ ඊට ආසන්න දෛනික වැටුපක් ඔවුන්ට හිමි විය යුතුය. තව ද, මෙම වැටුප වතු සමාගම් හි රැකියා අහිමි පුද්ගලික

අංශයේ කුඩා හා මධ්‍යම පරිමාණ වතුවල සේවය කරන පිරිසට ද හිමි විය යුතුය.  වතු සමාගම් හි සේවය නොකරන පුද්ගලික අංශයේ වතු කම්කරුවන් 40,000 ට ආසන්න ප්‍රමාණයට ද සමාන වැටුපක් ලැබිය යුතුය.

කෙසේ වෙතත්, මේ වන විට ප්‍රධාන වතු සමාගම් හි සේවය කරන කම්කරුවන්ගේ ශ්‍රමය වෙනුවෙන් පමණක් භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලෙන් මුදල් යෙදවීමට අයවැය යෝජනාවෙන් මෙසේ දක්වා ඇත. “රජය විසින් පැමිණීමේ දෛනික දිරිදීමනාවක් ලෙස රුපියල් 200ක් ගෙවීමට යෝජනා කරනවා”

මෙම අයවැය යෝජනාව රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ ආධුනිකයෙකු වන වත්මන් මුදල් අමාත්‍යාංශ ලේකම් හර්ෂණ සූරියප්පෙරුම මහතා අතින් සිදු වූ අත්වැරැද්දක් බව මාගේ දැඩි විශ්වාසයයි. භාණ්ඩාගාරයේ පළපුරුදු නිලධාරීන් අතින් මෙවැනි අත්වැරැද්දක් සිදු විය නොහැකිය. මීට පෙර ද අනීතික යෝජනා ඉදිරිපත් වී ඇතත්, ඒවා ක්‍රියාත්මක වීම නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරුන් විසින් වළක්වා ඇත. තවත් අතකින් මහා පරිමාණ වතු සමාගම් සේවකයින්ට පමණක් රජයෙන් වැටුප්/දීමනා ගෙවීම අනෙකුත් කුඩා හා මධ්‍ය  පරිමාණ වතු හිමියන්ට ද, සේවකයින්ට ද ‘වෙනස් ලෙස සැලකීම’ කි.

තවද, අප පාර්ලිමේන්තුව විසින් සම්මත කර දැනට ව්‍යවහාරයේ පවතින “රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත” මගින් මෙම වගකීම සම්පූර්ණයෙන්ම “අයවැය අධ්‍යක්ෂ ජනරාල්” වෙත පැවරේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් යම් වරදක් සිදු වූ විට රාජ්‍ය නිලධාරීන් අත්අඩංගුවට ගෙන, රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීමත්, පසුව අපරාධ චෝදනා ගොනු කිරීමත් අද පවතින ව්‍යවහාරයයි. එය වෙනුවට, රාජ්‍ය නිලධාරියෙකු/ නිලධාරීන්/ අමාත්‍ය මණ්ඩලය/කැබිනට් මණ්ඩලය අතින් ක්‍රමවේදයේ වරදක් සිදු වන බව නිරීක්ෂණය වන්නේ නම්, එය වළක්වාලීම/නිවැරදි කර ගැනීමට උපකාරවීමේ ආයතනික වගකීමක් ඔබ ආයතනයට පැවරෙන බව විශ්වාස කරමි.

මහජන නියෝජිතයෙකු ලෙස මාගේ අදහස වතු කම්කරු වැටුප් ඉහළ නැංවීම අත්‍යවශ්‍ය බව ය. එමෙන්ම, එය රජයේ මූල්‍ය හා පරිපාලන රෙගුලාසි අනුකූලව සිදු කිරීම ද අත්‍යවශ්‍යය.

වැවිලි සමාගම්හි සේවකයින්ට පමණක් රජයේ “ඒකාබද්ධ අරමුදල් මගින් වැටුප්/දීමනා” ගෙවීම සම්බන්ධයෙන් ඔබගේ නිරීක්ෂණ මුදල් අමාත්‍යාංශය සහ එහි නෛතික වගකීම දරණ අයවැය දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

එමගින් වතු කම්කරු වැටුප් සැබෑ ලෙසම වැඩිකිරීමට හැකිවන නීත්‍යානුකූල පරිසරයක් ගොඩනැගීම ද, කුඩා හා මධ්‍ය පරිමාණ වතුවල කම්කරුවන්ට ද අගතියක් නොවීමට ද, හේතුවනු ඇතැයි මම විශ්වාස කරමි. වතු කම්කරු ජීවන තත්වය ඉහළ නැංවීමට ඔබගෙන් ලැබෙන නිර්මාණශීලි දායකත්ව අගයමි.

මෙයට විශ්වාසී,

රෝහිණී කවිරත්න

මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී